# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2358/65 - 2023 නොවැම්බර් මස 17 වැනි සිකුරාදා - 2023.11.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්. ඩී. බී. 4/81 (II)

**1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත**

24ඇ හා 24ඈ වන වගන්ති යටතේ වූ නියමය

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 24ඇ සහ 24ඈ වන වගන්ති මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පරිසර අමාත්‍ය, කෙහෙළිය රඹුක්වැල්ල වන මා විසින්, මේ නියමය මගින් ''මුතුරාජවෙල පාරිසරික ආරක්ෂක ප්‍රදේශය '' යනුවෙන් හඳුන්වනු ලබන ප්‍රදේශය සම්බන්ධයෙන් ඉහත කී වගන්ති යටතේ සාදන ලදුව 2006 ඔක්තෝබර් 13 වන දින අංක 1466/26 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වන උපලේඛනය සහ III වන උපලේඛනය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

(1) එහි II වන උපලේඛනයේ 18 වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අයිතමය එකතු කිරීමෙන් :-

''19. පාරිසරික ආරක්ෂක ප්‍රදේශයේ දකුණු මායිම ඔස්සේ කෙරවලපිටිය ග්‍රිඩ් උපපොළ සිට නුගපේ හංදිය දක්වා සීබ්‍රා කුලුණු මත කිලෝවෝල්ට් 33ක ද්විත්ව පරිපථ රැහැන් මාර්ගය '' ;

(2) එහි III වන උපලේඛනයේ -

(අ) (ජ) අයිතමය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :-

''(ච) ව්‍යාපෘති යෝජනාවල ඇගයීම් ක්‍රියාවලිය සිදු කිරීම සහ ව්‍යාපෘති කටයුතු පසුවිපරම් කිරීම පිණිස මධ්‍යම පරිසර අධිකාරිය විසින් පරිපාලන ගාස්තු යෝජනා ක්‍රමයක් සකස් කර, අනුගමනය කළ යුතු ය '';

(ආ) (ච) අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන් :-

''(ජ) කෙරවලපිටිය ග්‍රිඩ් උපපොළ සිට නුගපේ හංදිය දක්වා සීබ්‍රා කුලුණු මත කිලෝවෝල්ට් 33ක ද්විත්ව පරිපථ රැහැන් මාර්ගය ඉදිකිරීම්, මෙහෙයුම් සහ නඩත්තු කිරීම්, පාරිසරික ආරක්ෂක ප්‍රදේශයට අගතිදායක බලපෑමක් නොවන පරිදි විය යුතුය ''.

කෙහෙළිය රඹුක්වැල්ල,
පරිසර අමාත්‍ය.

2023 ක් වූ නොවැම්බර් මස 07 දින,
කොළඹ දී ය.

EOG - 11-0178

1A - PG 6551 — 506 (2023/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*